**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 22 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව පරීක්ෂා කරන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණු බව මා ප්‍රකාශ කරමි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රැස්කර තිබුණු රු.153,872,368 ක ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා නොතිබුණි.

### (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ආපසු අයකර ගැනීම් හා අත්තිකාරම් ණය ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූල්‍ය ක්‍රියාකාරකම්වල නිරත වී නොතිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වල තැන්පත් ගිණුම් හා අනෙකුත් ක්‍රියාකාරකම්වල වැඩිවීම් ලෙස රු.9,733,420 ක් දක්වා තිබුණි.

### (ඇ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 2,407.11 ක් ලෙස දක්වා තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර නොතිබුණි. එම වත්කම් සම්බන්ධයෙන් උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වත්කම් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් තනතුර පුරප්පාඩුව පැවති හෙයින් එය පිරවීමට කාලපමාවක් සිදුවූ අතර නියෝග ලබා දීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් 11 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | වත්කම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |

**(ඇ)** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය**<br>------------<br>**නීති,රීති හා රෙගුලාසි වලට යොමුව**<br>-----------------------------<br>--- | <br><br>**වටිනාකම**<br><br>------------<br>-<br>රු. | <br><br>**අනුකූල නොවීම**<br><br>-------------------- | **නිර්දේශය**<br><br><br><br>------------ | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br><br>------------------- |
|---|---|---|---|---|
| **(අ)** **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**---------------------**<br>**---** | | | | |
| මුදල් රෙගුලාසි 715(2) | 35,172 | ගබඩා කටයුතු සම්බන්ධ රාජකාරි පැවරී ඇති නිලධාරින් නිසි පරිදි ගබඩා කටයුතු පවත්වා නොගැනීම හේතුවෙන් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොග විෂයන් 22 ක ඌණතාවයක් පැවතුණි. | මුදල් රෙගුලාසි 715(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. |
| **(ආ)** **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ**<br>**-----------------** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 08/2010 දරන චක්‍රලේඛය | 9,194,037 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් අවස්ථා 45 කදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 08/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අයකිරීම් සියල්ල ක්‍රමවත්ව සිදුවන අතර හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හමුදා වැටුප් සංශෝධන හේතුවෙන් වැඩිපුර ගෙවීම් සිදු වී ඇත. රිදීමාලියද්ද හා පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන අතර ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිපුර ගෙවීම් අනාවරණය වූ පසු අයකිරීම සිදු කරන බව දන්වා ඇත. |
| (ඈ) | **සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** -------------------- | | | | |
| | 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛය | 64,300 | දීමනාලාභීන්ගේ මියයෑම් සම්බන්ධව තොරතුරු විධිමත් පරිදි ලේඛනගත කර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමේ ප්‍රමාදයන්ද විය. මේ හේතුවෙන් දීමනාලාභීන්ගේ මරණයෙන් පසුවද ප්‍රාදේශීය ලේකම් | චක්‍රලේඛයේ 2.7 ඡේදය අනුව කටයුතු කර වැරදි ගෙවීම් මගහරවා ගත යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇතිවීම වැලැක්වීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාල 04 කට අදාළව ඔවුන්ගේ නියෝජිතයන්ට අවස්ථා 19 කදී වැඩිපුර දීමනා ගෙවා තිබුණි. | | |
| | 336,300 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව අඛණ්ඩව මාස 03 කට වැඩි කාලයක් දීමනාව ලබා නොගත් නමුත් දීමනා ලේඛනයෙන් නම ඉවත් කර නොතිබුණු අවස්ථා 32 ක් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් දීමනාව ලබා ගැනීමට හිමිකම් ඇති පාර්ශවයන්ට එම දීමනා ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි වී තිබුණි. | චක්‍රලේඛයේ 2.14 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරියේදී චක්‍රලේඛය අනුව කටයුතු කරන බව දන්වා ඇත. |
| **(ඇ) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ චක්‍රලේඛ** -------------------- --- | | | | |
| චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදෙස්මාලාව - iv හි 2.6 ඡේදය | 698,062 | 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාළ ප්‍රතිලාභීන් 87 ක් විසින් ගෙවිය යුතු ණය නියමිත දිනට නොගෙවා පැහැර හැර තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට ණය මුදල් අයකර ගත යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ඉ) **අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික් ප්‍රාදේශිය දුරස්ථ අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයට අදාළව පවත්වාගෙන යනු ලැබූ ස්ථාවර,ජංගම හා ඉතුරුම් බැංකු ගිණුම් 03 කට අදාළව 2018 ජුනි 30 දිනට රු.10,568,504 ක මුදල් ශේෂයක් පැවති අතර එම මුදල් ශේෂය කිසිදු මූල්‍ය ප්‍රකාශනයක දක්වා නොතිබුණි. | බැංකු ගිණුම්වල පවත්නා මුදල් ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | ගිණුම්වල ඇති මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරදෙන ලෙස රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

------------------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන** | | |
| (i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘතිවල හැඩයම් ලෑලි ගැසීමේ කාර්යය සඳහා ගෙවීම් කිරීමේ දී ඉටුකරන | නියමිත පිරිවිතර හා රේටයන් පදනම් කරගෙන ගෙවීම් කළ යුතුය. | නිවැරදි රේටයන් භාවිතා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ලද කාර්යයට අදාළ නොවන රේටයක් පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් රු.40,133 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ii) | ව්‍යාපෘති භූමියට ඉදිකිරීම් ද්‍රව්‍ය ගෙන ඒමේ කාර්යය සඳහා ප්‍රවේශ මාර්ග තිබියදී ඉදිකිරීම් ද්‍රව්‍ය කරබරින් ඔසවා ගෙන රැගෙන ඒම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ඉටු කරන ලද ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.85,203 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සැකසීමේදී භෞතික තත්ත්වයන් සැලකිල්ලට ගෙන ආර්ථික පිරිමැසුම්භාවයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ප්‍රවේශ මාර්ගය ගමනාගමන කටයුතු සඳහා සුදුසු තත්වයක නොපැවතුණු බව දන්වා ඇත. |
| (iii) | ව්‍යාපෘතිවල වැඩ සඳහා ගෙවීම් කිරීමේදී යොදාගත යුතු රේට වෙනුවට වෙනත් රේට පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ව්‍යාපෘති 07 ක් සඳහා රු.714,563 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත පිරිවිතර හා රේටයන් භාවිතා කළ යුතුය. | වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැති අතර අතපසු වීමකින් සිදුව ඇති දෙයක් බව දන්වා ඇත. |
| (ආ) | **ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - වැවක් සමඟ ගමක් වැඩසටහන** ---------------------------------------- | | |
| (i) | මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකරන ලද මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය අනුමත වර්ගයේ පස් ඝන මීටර් 450 ක් කැණීම සඳහා නියමිත රේටයට වඩා වැඩි රේටයක් ඇතුළත් කර ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීමේදී රු.158,240 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීම,පරීක්ෂා කිරීම හා අනුමත කිරීමේ අදියරයන්හිදි අදාළ ඇස්තමේන්තුවේ නිරවද්‍යතාවය මෙන්ම යෝග්‍යතාවය පිළිබඳව පරීක්ෂාකර බැලිය යුතුය. | ඇස්තමේන්තු සැකසීමේදී ප්‍රමාද දෝෂයකින් මෙම පස් ප්‍රමාණය ඇතුලත් කර ඇති අතර සත්‍ය ප්‍රමාණය පස් කියුබික් මීටර් 287.72 ක් බව දන්වා ඇත. |
| (ii) | ඝන මීටර් 200 ක් ඉක්මවා ඇස්තමේන්තු කරනු ලබන පස් ප්‍රවාහනය කිරීම සඳහා අදාළ වන ප්‍රවාහන පිරිවැයට | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙළ කර ඒ අනුව ගෙවීම් කළ යුතුය. | අතපසු වීමක් මත 200 cum වඩා අඩු රේටයක් භාවිතා කර ඇති බවද ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බවද |

| | | | |
|---|---|---|---|
| | වඩා වැඩි ප්‍රවාහන පිරිවැයක් ඇතුළත් කර ගෙවීම් කිරීම හේතුවෙන් මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකරන ලද ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.179,913 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | දන්වා ඇත. |
| (ඇ) | **ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**<br>**--------------------------------------**<br>**--** | | |
| | **ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2018**<br>**-------------------------------------**<br>**---** | ඉටු කර ඇති කාර්යභාර්ය පිළිබඳව නිවැරදිව පරීක්ෂා කර බලා ගෙවීම් කළ යුතුය. | වැඩිපුර ගෙවීමක් සිදුවී නොමැති බව දන්වා ඇත. |
| | (i) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකර තිබුණු ව්‍යාපෘතියකට වැරගැන්නුම් කම්බි යෙදීමේ කාර්යය සඳහා රු.26,882 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| | (ii) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග කොන්ක්‍රීට් කිරිමේ ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් මාර්ගය දෙපස හැඩයම් ලෑලි ගැසීම හා ගලවා ඉවත් කිරීමේ කාර්යය සඳහා අවම පිරිවැයක් සහිත රේටය භාවිතා කිරීම වෙනුවට ඊට ඉහළ වෙනත් රේටයක් පදනම් කර ගැනීම හේතුවෙන් රු.60,622 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අවම පිරිවැයක් යටතේ වන පිරිවිතර හා රේටයන් භාවිතා කළ යුතුය. | සියලු මාර්ග ඉදිකිරීම් අධික වර්ෂා කාලයේදී සිදු කළ බවද එම ස්ථාන මඩ වගුරු වලින් ගහන බැවින්ද එම රේටය භාවිතා කළ බව දන්වා ඇත. |
| | (iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ඉටු කරන | අවම පිරිවැයක් යටතේ වන පිරිවිතර හා රේටයන් | මෙම ව්‍යාපෘති සිදුකරන ග්‍රාමීය සමිති සඳහා අදාළ |

| | | |
|---|---|---|
| ලද මාර්ග කොන්ක්‍රීට් කිරිමේ ව්‍යාපෘති 03 ක් යන්ත්‍ර මගින් 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ රේටය භාවිතා නොකිරීම නිසා රු.22,059 ක් වැඩිපුර ගෙවා තිබුණි. | භාවිතා කළ යුතුය. | යන්ත්‍ර උපකරණ නොමැති බැවින් එම යන්ත්‍ර කුලියට ගැනීමේදී අමතර පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් මෙම රේටය භාවිතා කළ බව දන්වා ඇත. |
| (iv) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකර තිබුණු මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 07ක් සඳහා ටොන් 10ක කම්පන රෝලක් භාවිතා කිරීම වෙනුවෙන් රු.270,000 ක් ගෙවා තිබුණි. නමුත් එම කම්පන රෝල භාවිතා කළ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විශේෂ අයිතමයන් යොදාගැනීමේදී වගකිවයුතු පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව පිරිමැසුම්භාවයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | පෙර අත්දැකීම් අනුව ටොන් 10 රෝල භාවිතා කර මාර්ගය තද කිරීමෙන් දීර්ඝකාලීනව මාර්ගය භාවිතා කිරීමට හැකි නිසා මෙතෙක් මාර්ග සකස් කිරීම් වලදී ටොන් 8 – 10 රෝල යොදාගත් බව දන්වා ඇත. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 3.69 ක ශේෂයක් පැවතුණි. එම ශේෂයෙන් රු.මිලියන 1.85 ක ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාළ අවුරුදු 03 කට වැඩි - 05 කට අඩු ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බවද, ඌව පලාත් සභාවෙන් අයවිය යුතු අවුරුදු 10 කට වැඩි ණය ශේෂයන්හි ණය ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් හා සාකච්ඡා කළ බවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල |

| | | |
|---|---|---|
| | | 04 කට අදාළ අනෙකුත් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බවද දන්වා ඇත. |

## 2.3 තැන්පත් ශේෂයන්

---------------------

තැන්පත් ගිණුමේ ශේෂයයන් සම්බන්ධයෙන් සහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසන් වන විට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 248.28 ක් වී තිබුණි. එම ශේෂයෙන් රු.මිලියන 3.27 ක තැන්පත් ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතුය. | රු.107,011 ක තැන්පතු ගෙවා අවසන් කර ඇති අතර රු.923,600 ක් වූ තැන්පතු ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. රු.607,271 ක තැන්පතුවෙන් රු.506,525 ක් ගෙවා ඇත. ඉතිරි මුදල වූ රු.100,745 ක් අදාළ දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරන අතර රු.2,176,899 ක තැන්පතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ රුඳවුම් මුදල් බැවින් අලුත්වැඩියාවන් සඳහා රඳවා ගෙන ඇත. |
| (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළ එකතුව රු.759,855 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතුය. | පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති අතර ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉකුත් තැන්පත් ලැයිස්තු පිළියෙල කර ඇත. ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරියේදී එම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |
| (iii) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ | ප්‍රතිපාදන ලද විගස අදාළ කාර්යභාර්ය ඉටුකිරීමට | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම ප්‍රතිපාදනවලින් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු එකතුව රු.2,228,863 ක් වූ තැන්පතු 35 ක ප්‍රතිපාදන අදාළ කාර්යභාර්ය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කටයුතු කළ යුතුය. | කොටසක් මේ වන විට නිරවුල් කර ඇති අතර ඉතිරිය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**-------------------------------------------------------**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- |
|---|---|---|---|
| (i) | හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.494,890 ක් වැය කර උස්සැල්ල සතිපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නිම කර තිබුණත්, 2018 ඔක්තෝබර් 19 දින වන විටද එම ව්‍යාපෘතියෙන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අරමුණු නිසි පරිදි හඳුනාගෙන එම අරමුණු ඉටුවන අයුරින් ව්‍යාපෘති සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත මෙම ව්‍යාපෘතිය පවරා දී ඇති බව දන්වා ඇත. |
| (ii) | ඇල්ල නගරයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,078,890 ක් වැයකර 2016 දෙසැම්බර් 30 දින ඇල්ල නගරයට සීසීටීවී කැමරා පද්ධතියක් සවිකිරීමේ ව්‍යාපෘතිය නිමකර තිබුණි. 2017 වර්ෂය හා 2018 වර්ෂයේදී අවස්ථා 02 කදී එහි භෞතික පරීක්ෂාවන් සිදු කළ අතර එම අවස්ථාවන් 02 දීම | ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අරමුණු නිසි පරිදි හඳුනාගෙන එම අරමුණු ඉටුවන අයුරින් ව්‍යාපෘති සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | අවශ්‍ය කටයුතු අදාළ පාර්ශවයන් සමඟ සාකච්ජා කර ඉදිරියේදී කැමරා පද්ධතිය සවිකිරීම් කටයුතු සිදුකරන බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | | |
| (iii) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල සෙවන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.1,994,000 ක් වැය කර 2017 දෙසැම්බර් 29 දින ඉදිකිරීමේ කටයුතු නිම කර තිබුණි. එම ගොඩනැගිල්ල 2018 ඔක්තෝබර් 11 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | ඇස්තමේන්තු සැකසීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන ඊට උචිත අයුරින් ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කළ යුතුය. | ගොඩනැගිල්ල කඩිනමින් යථා තත්ත්වයට පත්කර එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සැප්තැම්බර් 25 දින රු.මිලියන 1.94 කට කොන්ත්‍රාත්කරු සමග වැඩ අවසන් කරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් එම ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 03 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන ඊට උචිත අයුරින් ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කළ යුතුය. | නිසි ප්‍රමිතියෙන් යුත් උළු නොතිබූ බවත් කල් දිගුවක් ලබා දුන් බවත් දන්වා ඇත. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් | අදාළ වැඩ හෝ සේවා ඉටු | මෙම අඩුපාඩු සම්පූර්ණ කරන |

| | | |
|---|---|---|
| එකතුව රු.427,117 ක් වැය කර ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබුණි. 2018 ජුලි 02 හා 2019 ජනවාරි 22 දින වන විටත් එම ව්‍යාපෘතිවල කාර්යයන් ඉටුකර නොතිබුණි. | කරවා ගැනීමෙන් පසුව පමණක් ගෙවීම් කළ යුතුය. | ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති අතර එතෙක් රඳවුම් මුදල් නිදහස් නොකරන බව බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති අතර ව්‍යාපෘතිය නිම කරවා ගැනීම සම්බන්ධයෙන් වූ විශ්වාසය මත ගෙවීම් සිදු කළ බවත් මේ වන විට වැඩ අවසන් කර ඇති බවත් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම**<br>--------------------------------------------<br>2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළ වාහන 04 ක අයිතිය පවරා ගැනිම සම්බන්ධයෙන් 2019 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති අතර රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පැවරුම් කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර වාර්තා කරන බව දන්වා ඇත. |
| (ආ) **වත්කම්වල නඩත්තුව හා අළුත්වැඩියා සිදු නොකිරීම**<br>------------------------------------------ | | |
| (i) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වර්ග අඩි 1647 කින් යුතු ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2009 වර්ෂයෙන් පසුව කිසිදු | වත්කම්වල අළුත්වැඩියාව අදාළ කාලපරිච්ඡේදයේම සිදු කිරීමට කටයුතු කළ | අළුත්වැඩියා කිරීම ආර්ථික වාසි නොවන බවත්, නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් පැරණි කාර්යාල |

| | | | |
|---|---|---|---|
| | නිලධාරියෙකු පදිංචි වී නොතිබුණි. එම ගොඩනැගිලිවල අළුත්වැඩියාවන් සිදු නොකිරීම නිසා දිරාපත් වෙමින් පැවතුණි. එම ගොඩනැගිල්ල විවිධ භාණ්ඩ හා ලිපිගොනු තැබීමේ ගබඩාවක් ලෙස භාවිතා කර තිබුණි. | යුතුයි. | ගොඩනැගිල්ලේ කොටසක් ඉවත් කිරීමට සිදුවීමෙන් භාණ්ඩ/උපකරණ තැබීමට එම ගොඩනැගිල්ල භාවිතා කළ බවත් දන්වා ඇත. |
| (ii) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර අවශ්‍ය අළුත්වැඩියාවන් නොකර කාර්යාල පරිශ්‍රයේ දිරාපත් වීමට ඉඩහැර තිබුණි. | වත්කම්වල අළුත්වැඩියාව අදාළ කාලපරිච්ඡේදයේම සිදු කිරීමට කටයුතු කළ යුතුයි. | අළුත්වැඩියා කිරීම ඵල රහිත බව මෝටර් රථ පරීක්ෂක දන්වා ඇති බවත්, කැබ්රථයේ අයිතිය පවරා ගත් පසු අදාළ ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා ඇත. |
| (ඇ) | **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**<br>-----------------------------------------<br>අනතුරට ලක් වී තිබුණු රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා අදාළ නියෝජිත ආයතනය වෙත යොමු කර තිබුණද අදාළ අළුත්වැඩියා කටයුතු නොකර වර්ෂ 01 මාස 06 කට වැඩි කාලයක් මුළුල්ලේ නියෝජිත ආයතන පරිශ්‍රයේ රඳවා තිබුණි. | රජය සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට වග බලා ගත යුතුය. | විමර්ෂණ කටයුතු අවසන් වී නොමැති බැවින් අළුත්වැඩියාවන් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී නොමැත. |

**3.5 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>------------------------------ |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වෑන් රථයක් 2014 ජූලි 08 දින අනතුරට ලක් වී තිබුණු අතර එම අනතුර හේතුවෙන් රු.191,632 ක අලාභ හානියක් සිදුවී තිබුණි. එම අලාභ හානියෙන් රු.138,369 ක් අදාළ රක්ෂණ | මුදල් රෙගුලාසි 103, 104 හා 109 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ අතර (2019.05.03) නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |

| | | | |
| --- | --- | --- | --- |
| | සමාගමෙන් අයකරගෙන තිබුණු අතර ඉතිරි රු.53,263 ක අලාභ හානිය ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | | |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වාහන අනතුරු 11 කට අදාළව රු.මිලියන 8.86 ක අලාභ හානි සිදුවී තිබුණි. එම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කර අලාභ හානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කළ යුතුය. | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථ අනතුර සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීමට පරීක්ෂණ මණ්ඩලය අමාත්‍යාංශ අනුමැතියට යවා තිබුණද අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බවද, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථ අනතුර සඳහා තක්සේරු වාර්තාව ලබාගෙන ඇති බවත්, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථ අනතුර සඳහා නඩුවක් විභාග වන බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රථයේ අනතුර සඳහා නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කර වගකිව යුතු පාර්ශව තීරණය කර ඉදිරි කටයුතු සිදුකරන බවත්, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථ අනතුර සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බවත්, තවත් කැබ්රථ 06 කට අදාළව සිදු වූ අනතුරු සඳහා මු.රෙ.104(4) යටතේ අලාභ හානි පිළිබඳ අවසාන වාර්තාවට අදාළ පරීක්ෂණ කටයුතු සිදුවන බවත් දන්වා ඇත. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී වැටුප ගණනය කිරීමට අදාළව කලින් කලට වෙනස් වීමට භාජනය වන නීති රීති, චක්‍රලේඛ, උපදෙස් ලිපි පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව විශ්‍රාමිකයින් 84 දෙනෙකුට රු.17,639,557 ක් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගැනීම හා චක්‍රලේඛ විධිවිධාන නිවැරදිව අනුගමනය කර විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක චක්‍රලේඛ, උපදෙස් පිළිබඳව දැනුවත් වී නොසිටීම නිසා හමුදා වැටුප් හා ජීවන වියදම් දීමනා ගෙවා ඇති බවත්, තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් කර තිබුණු වැඩිපුර ගෙවීම අයකර ගැනීම ආරම්භ කර ඇති බවත් ඉදිරියේදී මෙවැනි ගැටළු සිදු නොවීමට පියවර ගන්නා බවත් දක්වා ඇත. |
| (ii) | පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් ගෙවන ලද විශ්‍රාමිකයෙකුගේ මියයාම ග්‍රාම නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා නොකිරීම නිසා මියගිය විශ්‍රාමිකයෙකුට රු.61,622 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම මුදලින් 2019 මැයි 31 දින වන විටත් රු.36,622 ක් අයවිය යුතුව පැවතුණි. | විශ්‍රාමිකයන් මියගිය විට ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වහාම දැනුවත් කිරීමට ක්‍රමවේදයක් ඇතිකළ යුතුය. | වැඩිපුර ගෙවූ මුදල මියගිය විශ්‍රාමිකයාගේ උරුමකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත් 2018 අගෝස්තු 15 දින දක්වා රු.29,800 අයකර ගෙන ඇති බවත්, ඉතිරි මුදල වූ 36,622 ක මුදල අයකර ගැනීමට ඉල්ලීම් ලිපි යොමුකර ඇති බවත් දන්වා ඇත. |
| (iii) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් ගෙවූ විශ්‍රාමිකයෙකුගේ මරණය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිසි පරිදි දැනුම් දී තිබියදී ද ඊට අදාල කටයුතු නොකර 2017 මැයි මාසයේ සිට 2018 අප්‍රේල් මාසය දක්වා රු.353,738 ක් මිය ගිය විශ්‍රාමිකයා වෙනුවෙන් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | විශ්‍රාමිකයෙකුගේ මරණය පිළිබඳ තොරතුරු ලද වහාම එම ගෙවීම් අත්හිටුවීමට ක්‍රියාකරන ලෙස විෂය ලිපිකරු දැනුවත් කළ යුතු අතර රාජකාරි පැහැර හැරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | බැංකු ගත වී ඇතත් ගෙවීම් සිදුකර නොමැති බවත්, එය නැවත ගෙන්වා ගැනීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් දන්වා ඇත. |